## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/133/2022 (PSC)

ආර්.එම්.මනම්පේරි,

**අභියාචක**

**එදිරිව**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**වගඋත්තරකරු**

**දිනය :- 2025.05.14**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී :-** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

**පෙනී සිටීම :-** **අභියාචක වෙනුවෙන් රජයේ සේවක ඩබ්.පී.අයි.ටී. වීරසිංහ මහතා.**

**වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් මනේෂා නිශ්ශංක මිය පෙනී සිටී.**

### විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

### -<u>නියෝගය</u>-

**අභියාචක ආර්.එම්.මනම්පේරි යන අය විසින් ඉදිරිපත් කර ඇති 2022.11.02 දිනැති අභියාචනය මගින් ඉල්ලා ඇත්තේ, ඇය වෙත ඉදිරිපත් කරන ලද චෝදනාවෙන් නිදොස් කොට නිදහස් කර, ඇය වෙත පමුණුවා ඇති විනය දඬුවම අහෝසි කර දෙන ලෙසටයි.**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවන ලද 2022.10.03 දිනැති ලිපිය මගින් අභියාචක වෙත දන්වා ඇත්තේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන II) විසින් 2022.01.04 දිනැතිව කර ඇති විනය නියෝගයට එරෙහිව ඉදිරිපත් කරන ලද 2022.02.10 දිනැති අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කර ඇති බවයි.**

ඉහත සඳහන් 2022.01.04 දිනැති අතිරේක ලේකම් (පාලන II) යන අය විසින් අභියාචක වෙත පනවා ඇති විනය දඬුවම වන්නේ **එක් දිනක වැටුප දඩයක් ලෙස පනවා** තිබීමයි. මෙම දඬුවම පැනවීමට හේතුවී ඇත්තේ, අභියාචක වෙත ඉදිරිපත් කරන ලද චෝදනා දෙකකින් එකක් වන 2019.12.04 වෙනි දින අභියාචක විසින් ප්‍රධාන වෛද්‍ය නිලධාරිනිය වූ වෛද්‍ය ජේ.පී.ශ්‍රියානි මහත්මියට, රාජකාරි වේලාව තුළ රාජකාරියට බාධා කරමින් අපහාස වන අන්දමින් කටයුතු කළාය යන්නයි. එම චෝදනාවට පමණක් ඇය වරදකරු බවට කර ඇති අතර, අනෙක් චෝදනාවෙන් නිදහස් කර ඇත.

මෙහිදී ප්‍රථමයෙන් සඳහන් කළ යුතු වන්නේ අභියාචක වෙත පනවා ඇති දඬුවම පනවා ඇත්තේ මූලික විමර්ශනයක ප්‍රතිඵලයක් වශයෙන් බවයි. එකී මූලික විමර්ශනය පවත්වා ඇත්තේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරී ටී.ඒ.එස්.කේ. අබේසිංහ යන අය විසිනි. එකී පරීක්ෂණය පැවැත්වීමට හේතු සාධක වී ඇත්තේ ගාල්ල ප්‍රධාන වරායට අනුයුක්ත ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෛද්‍ය ජේ.පී.ශ්‍රියානි යන අය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක (නිරෝධානයන) වෙත යොමු කරන ලද 2019.10.23 සහ 2020.01.14 දිනයන් හි කරන ලද ලිඛිත පැමිණිලි දෙකයි. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ, ප්‍රශ්නගත විනය නියෝගය නිකුත් කර ඇත්තේ, පවත්වන ලද මූලික පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් බවයි. එබැවින් මෙහිදී මෙම මූලික පරීක්ෂණය මත විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නැති බව සඳහන් කළ යුතුය.

මූලික පරීක්ෂණයකින් අනතුරුව දඬුවම් පැමිණවීමේ බලය පැවරී ඇත්තේ, ආයතන සංග්‍රහයේ II වෙළුමේ 18 වන පරිච්ඡේදයේ, 25 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුවය. ඒ යටතේ දඬුවම් පැමිණවිය හැක්කේ, දඬුවම් නියම කිරීමට පාදක වන වරද, එතරම් බරපතල නොවන අවස්ථාවකදී පමණි. ඒ යටතේ පැනවිය හැකි උපරිම දඬුවම එක් දිනක වැටුප අයකර ගැනීම හෝ ඊට අඩු ස්වභාවයක් දරණ දඬුවමක් පමණි. එවැනි සුළු වරදක් සම්බන්ධයෙන් ලඝු ආකාරයේ වන මූලික

පරීක්ෂණයක් පැවැත්වීමේ දී, දඬුවමක් පනවනු ලබන්නේ, චෝදනාව එල්ල කරනු ලබන පුද්ගලයා වෙත, එම චෝදනාවට ඔහු හෝ ඇය වරදකරු නොකිරීමට හේතු තිබේ නම්, ඒවා ඉදිරිපත් කරන ලෙසට දැන්වීමෙන් අනතුරුවය. එකී 25 වන වගන්තිය යටතේ පනවනු ලබන දඬුවමක් සඳහා මූලික පරීක්ෂණයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය නොවේ.

කරුණු එසේ තිබියදී මෙම සිද්ධියට අදාළ ව දීර්ඝ වශයෙන් සාක්ෂි සටහන් කර ගැනීමෙන් අනතුරුව මූලික විමර්ශනයක් පවත්වා ඇත. එවැනි ආකාරයේ වූ මූලික විමර්ශනය පැවැත්වීමෙන් පසුව ගත යුතු ක්‍රියා මාර්ගය, ආයතන සංග්‍රහයේ ඉහත පරිච්ඡේදයේ 13 වන වගන්තියේ සහ ඉන් අනතුරුව ඇති වගන්ති වල පැහැදිලිව සඳහන් කර ඇත. එවැනි මූලික විමර්ශනයක් පැත්වීමෙන් අනතුරුව චූදිතයා වෙත පැහැදිලිව චෝදනා ඉදිරිපත් කරමින්, විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බව එකී ඉහත පරිච්ඡේදයේ 13 සිට 24 දක්වා වගන්ති වල පැහැදිලිව සඳහන් කර ඇත. මේ අවස්ථාවේ දී දීර්ඝ ලෙස මූලික විමර්ශනයක් පවත්වා තිබියදීත් ඒ මත ක්‍රියා කරමින් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නැත.

ඉහත කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ, විනය බලධාරියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව කටයුතු කරමින්, විධිමත් විනය පරීක්ෂණයක් නොපවත්වා, මූලික විමර්ශනයෙන් පසුව ආයතන සංග්‍රහයේ ඉහත සඳහන් 25 වගන්තියේ විධිවිධාන අනුගමනය නොකර, දඬුවමක් නියම කර ඇති බවයි. විධිමත් විනය පරීක්ෂණයක් නොමැතිව දඬුවමක් නියම කර ඇත්නම්, ඒ සඳහා මේ අවස්ථාවේ කටයුතු කළ ආකාරයේ මූලික විමර්ශනයක් පැවැත්වීම අනවශ්‍ය බව ඉහත සඳහන් කර ඇති 25 වගන්තියේ පැහැදිලිව සඳහන් වේ. එබැවින් මෙම අවස්ථාවේ දී අභියාචක වෙත දඬුවම් පැමිණවීමේ දී ආයතන සංග්‍රහයේ විධිවිධාන නොසළකා හරිමින් කටයුතු කර ඇති බවක් පෙනී යයි. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අවධානය යොමු වී නොමැත.

එම කරුණ මතම මෙම අභියාචනයට අවසර දීමට කටයුතු කළ යුතු බව මාගේ නිගමනයයි.

කෙසේ වෙතත් මෙම අවස්ථාවේ දී දෙපාර්ශවය විසින්ම මෙම සිද්ධියට අදාළවූ කරුණු සම්බන්ධයෙන් ඔවුනොවුන්ගේ දේශණ ඉදිරිපත් කර ඇති බැවින්, එම කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමි.

ඉහතින් සඳහන් කර ඇති පරිදි මූලික විමර්ශනය පැවැත්වූ විමර්ශණ නිලධාරියාගේ **2020.10.19** වන දිනැති වාර්තාවේ **5:2** යන ජේදයේ සඳහන් කර ඇති පරිදි, **2019.10.03** වෙනි දින කහැුන එන්නත් ලබාදීමට අදාළ සිදුවීමකදී, වෛද්‍ය ජේ.පී.ශ්‍රියානි යන අයගේ රාජකාරියට බාධාවක් වූ බවට කරුණු නිරීක්ෂණය නොවන බැවින්, ඒ සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බවට නිර්දේශ කර ඇත. ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති **2022.02.21** දිනැති වාර්තාවේ **10** වන ජේදයේ ද සඳහන් කර ඇත.

එසේ නමුත් මූලික විමර්ශනය පැවැත්වූ විමර්ශන නිලධාරියාගේ වාර්තාවේ **5:1** ජේදයේ සඳහන් කර ඇත්තේ, වෛද්‍ය ජේ.පී.ශ්‍රියානි යන අයගේ පැමිණිල්ලේ සඳහන් කර ඇති වචන මගින් ඇය වෙත බැන වැදී ඇති බවට මහජන සෞඛ්‍ය පරීක්ෂක අශෝක නන්දසේන යන අයගේ ප්‍රකාශයෙන් නිරීක්ෂණය වන බැවින්, ඒ සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසීම සුදුසු බවයි. එය එසේ තිබියදී, නිදහසට කරුණු විමසීමක් නොකරම, එම නිදේශය මතම දඬුවමක් පමුණුවා ඇත. ඉහතින් සඳහන් කර ඇති පරිදි එම තත්ත්වය, ආයතන සංග්‍රහයේ ක්‍රියා පටිපාටිය උල්ලංඝණය කිරීමකි.

ඉහත මූලික විමර්ශනය පැවැත්වූ නිලධාරියා සඳහන් කර ඇති පරිදි, "**බැන වැදීම**" යන චෝදනාව සනාථ කිරීම සඳහා ඉදිරිපත්ව ඇත්තේ අශෝක නන්දසේන යන අයගේ ප්‍රකාශය පමණි.

විමර්ශන නිලධාරියාගේ වාර්තාවේ **4:1** සහ **4:2** ඡේදයන් හි පැමිණිලිකාර ජේ.පී.ශ්‍රියානි යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, එන්නතක් ලබාදීමේ ඇතිවූ සිද්ධියක් සම්බන්ධයෙන් පමණි. ඇයට අපහාස වන අන්දමින් වචන හැසිරවීමක් ගැන කිසිදු සඳහනක් ඇය විසින් කර නැත. එකී වාර්තාවේ **4:2** ඡේදයේ සඳහන් කර ඇත්තේ අභියාචක විසින් දී ඇති සාක්ෂිය කහඋන එන්නත ලබාගැනීම සම්බන්ධයෙන් බවයි. බැන වැදීමක් ගැන එහි සඳහන් කර නැත. අභියාචක විසින් කර ඇති ප්‍රකාශයෙහි, එවැනි බැන වැදීමක් සම්බන්ධයෙන් වන කරුණු ඇය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

මූලික විමර්ශනයේදී සාක්ෂි දී ඇති සමන්ත උදයංග යන අය ප්‍රකාශ කර ඇත්තේ,

**"වෛද්‍යතුමිය මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියගෙන් මොනවද විමසුවා. එහිදි ඒ කතාව දුරදිග ගියා. දෙන්නා දෙන්නාට කියවා ගත් අතර, එලෙස දෙදෙනා කියාගත්තේ මොනවාදැයි මට ස්ථිරවම මතක නැහැ"**

යනුවෙනි. විමර්ශන නිලධාරියා එකී සාක්ෂිකාරියගෙන් ප්‍රශ්න අසා ඇත්තේ මෙම සිද්ධිය ඔහුට යෝජනා කිරීමෙන් අනතුරුව. එයට පිළිතුරු වශයෙන් ඔහු පවසා ඇත්තේ, සාමාන්‍යයෙන් වෛද්‍ය ශ්‍රියානි මිය විසින් නිරන්තරයෙන් වචන හුවමාරු කරගෙන, දෙන්නාට දෙන්නා අපහාස වන අයුරින් බනින්බස් වීම් කරගත් බවයි. එවැනි ප්‍රශ්නයක් පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින්ම ස්වාධීන සාක්ෂිකරුවෙකුට යොමු කිරීමෙන්, ඔහුගේ ස්වාධීනත්වය හා විශ්වසනීය භාවය සම්බන්ධයෙන් සැකයක් මතුවේ. මෙම විමර්ශන නිලධාරියා විසින්, අශෝක නන්දිසේන යන සාක්ෂිකරු සාක්ෂි දෙන අවස්ථාවේ දි අභියාචක විසින් ලිඛිතව ඉදිරිපත් කරන ලද පැමිණිල්ල අඩංගු ලිපියද පෙන්වා සාක්ෂි දෙන ලෙස පවසා ඇත. ඒ මගින් ද පිලිබිඹු වන්නේ විමර්ශන නිලධාරියා ඔහුගේ කාර්ය භාරයෙන් පරිබාහිරව ගොස්, වෛද්‍ය නිලධාරිනියට පක්ෂපාතී වන අන්දමට ප්‍රශ්න අසා ඇති බවයි.

වෛද්‍ය නිලධාරී ශ්‍රියානි යන අය ප්‍රකාශ කර ඇත්තේ, අභියාචක සමඟ ඇති වූ සිද්ධිය ඇය විසින් පටිගත කරන ලද බවයි. විමර්ශන නිලධාරියාගේ 4:9 ඡේදයේ සඳහන් කර ඇත්තේ, එකී හඬ පටය ඔහු විසින් ශ්‍රවනය කළ බවත්, එහිදී සාකච්ඡාවක් පිළිබඳව කරුණු පමණක් ඇති අතර, එම සාකච්ඡාවට බාහිරින් කාන්තා කට හඬක් ඇසෙන නමුත්, එය මනම්පේරි මියගේදැයි නිශ්චිතව කිව නොහැකි බවයි. එවැනි තත්ත්වයක් යටතේ එකී හඬ පටය මත ක්‍රියා කරමින් අභියාචක වරදකරු කිරීම දෝෂ සහගතය.

මෙවැනි පසුබිමක් යටතේ සුළු වරදක් හැටියට සැළකෙන "**බැන වැදීම**" යන මෙම චෝදනාවට, අභියාචක වරදකරු කරමින් දඬුවම් පැමිණවීම නිවැරදි නොවේ. ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව එවැනි චෝදනාවක් ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ද නොමැති බව පෙනී යයි.

මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ, මෙම සිද්ධිය සිදුවීමෙන් මාස 1 1/2ක් පමණ ගතවීමෙන් පසුව වෛද්‍ය ශ්‍රියානි යන අය අභියාචකට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබීමය. ඒ අනුව පැමිණිල්ල කර තිබෙන්නේ 2020.01.14 වෙනි දින වන අතර, සිද්ධිය සිදුවී ඇත්තේ 2019.12.04 වෙනි දිනදීය. 2019.10.03 වෙනි දින සිද්ධියට අදාළ පැමිණිල්ල වන්නේ, කහඋන එන්නත ලබා ගැනීම සම්බන්ධ සිද්ධියයි. එම චෝදනාවට අභියාචක වැරදිකරු වී නොමැත. කිසියම් බැන තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරන්නේ නම්, එම සිද්ධිය සිදුවූ වහාම ඒ සම්බන්ධයෙන් පැමිණිල්ල කර තිබිය යුතුය. නමුත් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ, 2020.01.14 දිනැති ලිපිය මඟිනි. කිසියම් සිද්ධියක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට ගෙන ඇති ප්‍රමාදය, එම සිද්ධිය ඒ ආකාරයෙන් සිදුවූයේ ද යන්න ස්ථිර වශයෙන් ම තීරණය කිරීමට බාධාවක් වනවා ඇත.

මෙවැනි තත්ත්වයක් යටතේ බැන වැදීම නැමැති චෝදනාව ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් නොවන බැවින්, එම චෝදනාවට වැරදිකරු

කරමින් දඩුවම් පැමිණවීම දෝෂ සහගතය. එකී තීරණයට එකඟ වෙමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගෙන ඇති තීරණය ද ඒ ආකාරයෙන්ම දෝෂ සහගත වන අතර, එය පවත්වාගෙන යාමට හැකියාවක් නැත.

ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවන ලද 2022.10.03 දිනැති ලිපියේ සඳහන් තීරණය, වැරදි සහගත තීරණයක් බවට තීරණය කරමින්, එය ඉවත් කිරීමට තීරණය කරමු. මෙම තීරණය හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ 2022.01.04 දිනැති තීරණය ද අහෝසි විය යුතුය.

ඒ අනුව නිසි පියවර ගෙන අභියාචක වෙත දැනුම් දීමට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට තවදුරටත් දන්වා සිටිමු.

ඉහත කරුණු සළකා බලා අභියාචක ඉදිරිපත් කර ඇති අභියාචනයට ඉඩදෙමු.

අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-